# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 26 දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1974 අගෝස්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 26 දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1974 අගෝස්තු මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 18/74

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, එහි සාමාජිකයන් එකඟ වන රීති අනුව එහි පරමාර්ථ එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය විසින් එහි පරමාර්ථ සාර්ථක ලෙස මෙතෙක් කල් ක්‍රියාත්මක කැරගෙන ගොස් ඇති හෙයින් හා එම ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ආයතනය සංස්ථාගත කිරීම යෝග්‍ය හා අවස්ථානුකූල වන හෙයින් ද:

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 26 දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භවන දිනයෙහි හා ඊට පසු, (මෙහි මින් පසු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනයේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් සියලු තැනැත්තන්, හෝ මෙසින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන (මේ පනතට යාකොට ඇති දෙවන උපලේඛනයෙහි නම් හා ලිපිනයන් දක්වෙන ආරම්භක සාමාජිකයන් ඇතුළු) සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය යන නාමය යටතේ අවිච්ඡින්න පරම්පරාවක් සහිත සංස්ථාවක් විය යුතුවාක් මෙන්ම එය එසේ වන්නේය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද කැමති පරිදි එය වෙනස් කිරීමේ හා අමුතු කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇති අතර ඒ නමින් සියලු අධිකරණයන්හි නඩු පැවරීම ද නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

සංස්ථාවේ සාමාන්‍ය පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පරමාර්ථ සඳහා ද ඒ සාමාන්‍ය පරමාර්ථ පහත සඳහන් පරිදි මෙසින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) සාමාන්‍ය වෛද්‍යවරුන් සඳහා ශාස්ත්‍රීය හා අධ්‍යාපන මූල ස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(ආ) ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ වෛද්‍ය දැනීම හා කෞශල්‍යය වර්ධනය කිරීම පිණිස අරමුණු කැරුණු අභ්‍යාස පාඨමාලා හෝ වෙනත් අධ්‍යාපන කටයුතු භාර ගැනීම හෝ එසේ භාර ගැනීමෙහි ලා අන්‍යයන්ට සහායවීම;

1*—ඒ 01509—0605 (74/03)

(ඇ) යම් අංශයක සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය දියුණු කිරීමේ අදහසින් වෛද්‍ය කරුණු පිළිබඳව සාමාන්‍ය වෛද්‍යවරුන් විසින් පර්යේෂණ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ධෛර්යය දීම හා එවැනි පර්යේෂණ භාර ගැනීම හෝ එවැනි පර්යේෂණ භාර ගැනීමෙහි ලා අන්‍යයන්ට සහාය වීම ;

(ඈ) සාමාන්‍ය වෛද්‍ය වෘත්තියට සම්බන්ධ වෛද්‍ය හෝ විද්‍යා විෂයයන් පිළිබඳ මුල් පොත් සාමාන්‍ය වෛද්‍යවරුන් විසින් පළ කරනු ලැබීමට ධෛර්යය දීම ;

(ඉ) සංස්ථාව පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අදාළ හෝ සම්බන්ධ සියලු කරුණුවලදී ලාභ ලැබීම පිණිස ඇතිකර නො ගත් අන් මණ්ඩල සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම ; හා

(ඊ) නිබන්ධයක් මත හෝ වේවා සාමාන්‍ය වෛද්‍ය වෘත්තියෙහි හෝ එයට සම්බන්ධ විශිෂ්ට කෘතියක් මත හෝ වේවා සාමාන්‍ය වෘත්තිය සඳහා සමස්තයක් වශයෙන් හෝ යම් විෂයයක් සම්බන්ධයෙන් තිබීමට නියමිත පශ්චාත් උපාධි අභිඥාන පත්‍රයක් ප්‍රදානය කිරීමෙහි දී (1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන අනුව ලංකා විශ්ව විද්‍යාලය සමග අනුබද්ධ වී පිහිටුවන ලද) පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපන ආයතනය සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම :

එසේ වුව ද සංස්ථාව පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ හා ඒවාට ආනුෂංගික බලතල පහත සඳහන් විධිවිධාන වලට යටත් විය යුතු ය. ඒ විධිවිධාන නම් :—

(i) යම් නියෝගයක්, සීමා කිරීමක් හෝ කොන්දේසියක් සාමාජිකයන්ට හෝ වෙනත් අයට නියම කිරීම හෝ ඔවුන් ලවා අනුගමනය කරවා ගැනීම සංස්ථාවේ පරමාර්ථයක් වුවහොත් ඒ නිසා සංස්ථාව වෘත්තීය සමිතියක් විය හැකි නම් එබඳු නියෝගයක්, සීමාකිරීමක් හෝ කොන්දේසියක් එසේ නියම කිරීමේ හෝ අනුගමනය කරවා ගැනීමේ පරමාර්ථයකට හෝ ප්‍රයත්නයකට සංස්ථාවේ අරමුදලින් ආධාර කිරීම සංස්ථාව විසින් නොකළ යුතු ය.

(ii) සංස්ථාවේ අනුග්‍රහය යටතේ යම් විභාගයක් සමත්වීම හෝ සංස්ථාව විසින් නිකුත් කරනු ලබන යම් අභිඥාන පත්‍රයක් හෝ සහතිකයක් දැරීම ලියාපදිංචි කරන ලද වෛද්‍යවරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා සුදුසුකමක් විය යුතු ය යනුවෙන් නියමින් හෝ අනියමින් නීති සම්මත කරවා ගැනීමට සංස්ථාව උත්සාහ නො කළ යුතු ය.

සංස්ථාවේ මණ්ඩලය.

4. (1) සංස්ථාවේ කටයුතු, මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව ඒ රීතිවලින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි හා ඒ අනුව තෝරා පත් කර ගනු ලබන යම් නිලධරයන්ගෙන් හා වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විතවන සංස්ථාවේ මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතට යාකොට ඇති දෙවන උපලේඛනයෙහි නම් දැක්වෙන ආයතනයේ ආරම්භක සාමාජිකයන් සංස්ථාවේ පළමුවන මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු පවත්වනු ලබන පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම තෙක් ඔවුන් ධුර දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ නාම ලේඛනය.

5. (1) මේ පනත සම්මත වන දිනයෙහි සංස්ථාවේ සාමාජිකයකුව සිටින සෑම තැනැත්තකුම ඇතුළත්වන නාම ලේඛනයක් පවත්වා ගෙන යාමට සංස්ථාවේ මණ්ඩලය විසින් සැලැස්විය යුතු අතර, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ ඉක්බිතිව යථා පරිදි ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තකුම විසින් ඔහුගේ නම එහි සටහන් කරවා ගත යුතු ය.

(2) පහත සඳහන් විස්තර නාම ලේඛනයෙහි අන්තර්ගත විය යුතු ය:—

(අ) එක් එක් සාමාජිකයාගේ නම හා ලිපිනය;

(ආ) වෛද්‍යවරයකු වශයෙන් සාමාජිකයා බඳවාගන්නා ලද දිනය;

(ඇ) සාමාජිකයාගේ වෘත්තීය සුදුසුකම් හා ඔහු වෙත පිරිනැමුණු උපාධි;

(ඈ) සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකුගේ නම නාම ලේඛනයෙහි සටහන් කරන ලද දිනය; හා

(ඉ) යම් තැනැත්තකු සාමාජිකයකුව සිටීම නතර වූ දිනය.

රීති සෑදීමේ බලය.

6. (1) සංස්ථාව විසින් කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකදී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට නො ගැළපීමක් නො වන රීති සෑදීම හා සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ තෝරපීම පිළිබඳව සංස්ථාවේ මණ්ඩලයේ හා ඒ සංස්ථාවේ නා නා නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ යුතුකම් ඉටුකර ගෙන යාම පිණිස ද අන්‍යාකාරයෙන් සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය හා එහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ද යෝජනා සම්මත කිරීම නීත්‍යනුකූල විය යුතු ය. ඒ රීති හා යෝජනා පනවනු ලැබූ හා සම්මත කරනු ලැබීමෙන් පසු සමාන රැස්වීමක දී හා සමාන ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතට යාකොට ඇති පළමුවන උපලේඛනයෙහි දක්වෙන රීති (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනත යටතේ පනවනු ලබන රීති මගින් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ ගණන්.**

**7.** සංස්ථාවට ලැබෙන හා සංස්ථාව විසින් වැය කෙරෙන සියලු මුදල් පිළිබඳ නිසි ගණන් තැබවීමට සංස්ථාවේ මණ්ඩලය විසින් සැලැස්විය යුතු අතර, සංස්ථාවේ ගණන් සෑම අවුරුද්දකට ම එක් වරක්වත් ගණන් පරීක්ෂණයට භාජන කරනු ලැබීම ද අයවැය ගණන්වල හා ශේෂපත්‍රයේ නිවැරදිභාවය යථාපරිදි සුදුසුකම් ලත් ගණන් පරීක්ෂකයකු හෝ ගණන් පරීක්ෂකයන් විසින් සහතික කරනු ලැබීම ද කළ යුතු ය.

**ආයතනය විසින් හා ආයතනයට ගෙවිය යුතු ණය.**

**8.** මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි ආයතනයේ පවත්නා සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එකී දිනයෙහි ආයතනයට අයවිය යුතු සියලු ණය හා ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**මුදල් හා දේපළ යෙදවීම.**

**9.** කවර විටක නමුදු ලත් සංස්ථාවේ මුදල් හා දේපළ මෙහි දක්වෙන සංස්ථාවේ පරමාර්ථ වර්ධනය කිරීම පිණිස පමණක් ම යොදනු ලැබිය යුතු අතර, එයින් කිසිම කොටසක් ලාභාංශ, ප්‍රසාද මුදල් ආකාරයෙන් හෝ අන් කවර හෝ ලාභයක ආකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට නියමින් හෝ අනියමින් ගෙවීම හෝ පැවරීම කරනු නො ලැබිය යුතු ය.

**දේපළ දැරීමට සංස්ථාව සතු බලය.**

**10.** මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ, තෑගිදීමේ හෝ බදුදීමේ යම් සාධන පත්‍රයක් පිට හෝ එවැන්නක බලය ප්‍රකාර හෝ යම් අන්තිම කැමැති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් පිට හෝ එවැන්නක බලය ප්‍රකාර හෝ අන් ආකාරයකින් චංචල හෝ නිශ්චල යම් දේපළක් අර්ථලාභී අයිතිකරුවකු, භාරකරුවකු හෝ අන් තැනැත්තකු වශයෙන් අත් කර ගැනීමට හෝ දැරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව තිබිය යුතු අතර, සංස්ථාව විසින්, මේ පනතේ කාර්යයන් සඳහා ද භාරයන්හි කාර්යයන් සඳහා හා ඒවා පිට සංස්ථාවේ හෝ අන් ආකාරයකින් තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්වද අදාළ සාධන පත්‍රයෙහි හෝ දේපළ බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයක අන්තර්ගත කොන්දේසිවලට යටත්ව ද (භාරයන්ට අදාළ යම් ලිඛිත නීතියක හා අදාළ සාධන පත්‍රයෙහි හෝ දේපළ බැහැර කිරීමේ අන්තිම කැමැති පත්‍රයක විධිවිධානවලට හැම විටම යටත්ව) ඒ දේපළෙහි අයිතිය හෝ භාරය විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, මාරුකිරීමේ, හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ බලය ඇතිව ඒ දේපළ දැරිය යුතු ය.

**දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම, ණය ගැනීම යනාදිය පිළිබඳ බලය.**

**11.** සංස්ථාව විසින්,—

(අ) සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වූ ද, ඒ කාර්යයන් සඳහා නීත්‍යනුකූලව අත්කරගත හැකි වූ ද ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම හා අන් ආකාරයකින් ලබා ගැනීම හා සංස්ථාවේ පරමාර්ථ වර්ධනය කිරීමේ අදහසින් අවස්ථානුකූලයයි සැලකෙන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම ද නීත්‍යනුකූල විය යුතු ය;

(ආ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සංස්ථාව සුදුසුයයි සලකන ආකාරයකින් ආයෝජනය කිරීම හා එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ හුවමාරු කිරීම නීත්‍යනුකූල විය යුතු ය;

(ඇ) සංස්ථාවේ කාර්යයන් සඳහා යම් ඇපයක් පිට මුදල් ලබා ගැනීම හෝ ණයට ගැනීම හා සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් යෝග්‍යයයි සලකන යම් ආකාරයකින් ආරක්ෂා කිරීම හෝ නිදහස් කිරීම නීත්‍යනුකූල විය යුතු ය;

(ඈ) සංස්ථාවේ පරමාර්ථවල කාර්යයන් සඳහා අදහස් කැරුණු ආධාර මුදල් පිළිගැනීම නීත්‍යනුකූල විය යුතු ය;

(ඉ) යම් පුණ්‍යාධාර කාර්යයක් සඳහා මුදලින් සම්මාදම් දීම හෝ වගකීම නීත්‍යනුකූල විය යුතු ය;

(ඊ) යම් නීත්‍යනුකූල භාරයන් හා සංස්ථාව හෝ අන් කිසි පුණ්‍යාධාර සංගමයක්, ආයතනයක්, සමිතියක්, මණ්ඩලයක් හා අන් කිසි පුණ්‍යාධාර භාර වෙනුවෙන් දරනු ලබන හෝ අයිතිකරගත් හෝ දැරිය යුතු හෝ අයිතිකර ගත යුතු යම් උපලබ්ධ හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා පරිපාලනය කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

12. සංස්ථාවේ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම නීත්‍යනුකූල ලේඛනයකට සංස්ථාවේ මුද්‍රාව නො යෙදිය යුතු ය. ඒ සාමාජිකයන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ නීත්‍යනුකූල ලේඛනයට අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට ස්වාධීනව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

13. සංස්ථාවේ සාමාජිකයකුගෙන් සංස්ථාවට අයවිය හැකි යම් වාර්ෂික සාමාජික ගාස්තු මුදලට වැඩි යම් දායක මුදලක් සංස්ථාවේ ණය හා බැරකම් පියවීමේ කාර්යය සඳහා හෝ අන් කිසි කාර්යයක් සඳහා, ගෙවීමට කිසිම සාමාජිකයකු යටත් නො විය යුතු ය. සාමාජිකයන්ගේ බැරකම් සීමා කිරීම.

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරිවුව හොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කෙරුණාවූ ද අන් කිසි ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේදී ම හෝ ඊට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන නිර්ණය කරනු ලැබිය යුතුය. ඒ දේපළ හෝ එහි යම් කොටසක් මේ වගන්තියේ විධිවිධාන අනුව බැහැර කළ නොහැකි වුවහොත් ඒ දේපළ හෝ කොටස සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කළ යුතු යම් පුණ්‍යාධාර පරමාර්ථයක් සඳහා යොදනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

1**—ඒ 01569 (74/08)

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**15.** මේ පනතෙහි සඳහන් ආයතන හා ඒවා මගින්, ඒවායින් හෝ ඒවා යටතේ හිමිකම්පාන ආයතන හැර ජනරජයේ හෝ දේශපාලන හෝ නීතිගත මණ්ඩලයක හෝ අන් කිසි තැනැත්තන්ගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි අන්තර්ගත කිසිවක් බල නොපෑ යුතු අතර එසේ බලපාන ලෙස සලකනු නො ලැබිය යුතුය.

## පළමුවන උපලේඛනය

### රීති

**සාමාජිකත්වය.**

1. (අ) වෛද්‍යවරයකු—

(i) ඔහුට එම්. බී. බී. එස්. හෝ එල්. එම්. එස්. සුදුසුකම ලැබීමෙන් පසු හෝ ඔහු එක්සත් රාජධානියේ වෛද්‍ය විද්‍යාලයක අධිකාරී පත්‍ර ලද්දකු වීමෙන් පසු සවන් පිරිසෙසින් අවුරුදු දහයක්වත් ගතවී ඇත් නම්; හා

(ii) සාමාන්‍ය වෛද්‍යවරයකු වශයෙන් සවන් පිරිසෙසින් අවුරුදු දහයකවත් කාලය තුළ ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිට ඇත් නම්

ආරම්භක සාමාජිකයකු වීමට සුදුසු විය යුතු ය.

(ආ) යථා පරිදි සුදුසුකම්ලත් වෛද්‍යවරයකු විසින්,—

(i) ඔහු සාමාන්‍ය වෛද්‍යවරයකු වශයෙන් සවන් පිරිසෙසින් අවුරුදු දහයකවත් කාලය තුළ ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටියේ නම්, හා

(ii) මේ පනත ආරම්භවීමේ දින සිට හය මාසයක් ඉකුත්වීමට පෙර සංස්ථාවේ සාමාජිකත්වය සඳහා ඔහු ඉල්ලුම් කරන්නේ නම්

සංස්ථාවේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(ඇ) මේ පනත ආරම්භවීමේ දින සිට හයමාසයක් ඉකුත්වීමෙන් පසු කිසිම තැනැත්තකු—

(i) ඔහු සවන් පිරිසෙසින් අවුරුදු දහයකවත් කාලය තුළ සාමාන්‍ය වෛද්‍යවරයකු වශයෙන් ක්‍රියාකාරී සේවයේ යෙදී සිටියේ නම් මිස;

(ii) පශ්චාත්-උපාධි වෛද්‍ය අධ්‍යාපන ආයතනය විසින් නියම කරන ලද යම් අභ්‍යාස පාඨමාලාවක් ඔහු සාර්ථක ලෙස සම්පූර්ණ කර යම් විභාගයකින් සාමර්ථ්‍ය ලබා ඇත්තේ නම් මිස; හා

(iii) ඒ තැනැත්තා සංස්ථාවේ සාමාජිකයකු හෝ සංගමිකයකු වශයෙන් ඇතුළත් කර ගැනීමට හෝ තෝරා පත් කර ගැනීමට සුදුසු බවට පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපන ආයතනය විසින් සහතික කර ඇත් නම් මිස

සංස්ථාවේ සාමාජිකත්වයට ඇතුළත් කර ගනු ලැබීම හෝ තෝරා පත් කර ගනු ලැබීම හෝ සංස්ථාවේ සාංගමිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීම නො කළ යුතු ය.

(ඈ) සංස්ථාවේ සාමාජිකයන් හෝ සංගමිකයන් වශයෙන් ඇතුළත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතු අතර මණ්ඩලයේ තීරණ සම්බන්ධයෙන් යම් හේතුවක් දැක්වීමට මණ්ඩලය බැඳී නොසිටිය යුතුය:

එසේ වුව ද පශ්චාත්-උපාධි වෛද්‍ය අධ්‍යාපන ආයතනය විසින් 1 වන රීතියේ (ඇ) (iii) ඡේදය අනුව ඒ සඳහා සහතික කරනු ලැබූ යම් තැනැත්තකු සංස්ථාවේ සාමාජිකයකු හෝ සාංගමිකයකු වශයෙන් ඇතුළත් කර නොගැනීමට හෝ තෝරා පත් කර නොගැනීමට මණ්ඩලය තීරණය කරන අවස්ථාවක, මණ්ඩලය විසින් එකී ආයතනය වෙත ඒ හේතු දන්වා යැවිය යුතු අතර, එකී ආයතනය විසින් ඒ සඳහා ඉල්ලා සිටි විට මණ්ඩලය විසින් මණ්ඩලයේ එකී තීරණය නැවත සලකා බැලිය යුතු ය. තව ද ඒ නැවත සලකා බැලීමේ දී ගන්නා තීරණය අවසානාත්මක විය යුතු අතර එය එකී ආයතනය වෙත දන්වා යවනු ලැබිය යුතු ය.

(ඉ) මේ පනතට යාකොට ඇති දෙවන උපලේඛනයෙහි නම් දක්වෙන තැනැත්තන් සංස්ථාවේ ආරම්භක සාමාජිකයන් විය යුතු ය.

මහා සභා රැස්වීම්

2. (අ) වාර්ෂික මහා සභා රැස්වීමක් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබ රැස්වීම කැඳවන දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන යම් වේලාවකදී හා ස්ථානයක දී සෑම අවුරුද්දකට සවිත් පිරිසෙසින් එක් වරක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(ආ) මූල් නිරීක්ෂණ පිළිබඳව හෝ පර්යේෂණ පිළිබඳ ව සාමාජිකයන් විසින් ලිපි ඉදිරිපත් කළ හැකි මහා සභා රැස්වීමක් සෑම අවුරුද්දකට යටත් පිරිසෙයින් දෙවරක්වත් පවත්වනු ලැබිය යුතු ය. ඒ ලිපි පළකරනු ලැබුව හොත් ඒවායේ ප්‍රකාශන අයිතිය ලේකම් විසින් තබා ගත යුතු ය.

(ඇ) අවශ්‍යයයි මණ්ඩලය සිතන කවර අවස්ථාවක වුවද අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට මණ්ඩලය විසින් කටයුතු කළ හැකි ය. ඒ අතිවිශේෂ මහා සභා රැස්වීම සම්බන්ධයෙන් සති දෙකකවත් දැන්වීමක් සෑම සාමාජිකයකු ම වෙත කරනු ලැබිය යුතු ය.

(ඈ) වෛද්‍ය විෂයයන් සම්බන්ධයෙන් දේශන පැවැත්වීමට සංස්ථාවේ සාමාජිකයන් නොවන තැනැත්තන්ට මණ්ඩලය විසින් ආරාධනා කළ හැකි ය.

(ඉ) සියලු සභා රැස්වීම් සංවිධානය කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය වග කිව යුතු ය.

මහා සභා රැස්වීම් සම්බන්ධයෙන් දැන්වීම.

3. (අ) වාර්ෂික මහා සභා රැස්වීමක් හෝ විශේෂ යෝජනාවක් සම්මත කිරීමට යෝජිත යම් මහා සභා රැස්වීමක් දින විසි එකකටවත් කලින් ලියවිල්ලකින් කරනු ලබන දැනුම්දීමකින් පසුව ද අන් කිසි මහා සභා රැස්වීමක් දින දහහතරකටවත් කලින් ලියවිල්ලකින් කරනු ලබන දැනුම්දීමකින් පසුව ද (අවස්ථා දෙක්හිදී ම රැස්වීම කැඳවනු ලබන දිනය අත්හැර) කැඳවනු ලැබිය යුතු අතර එවැනි දැන්වීමක් මෙහි මින් මතු සඳහන් කරනු ලබන ආකාරයට ගණන් පරීක්ෂකයන් හා සියලුම සාමාජිකයන් අතර සංසරණය කරවනු ලැබිය යුතු ය:

එසේ වුව ද දැන්වීමක් ලැබීමට හිමිකම් ඇති තැනැත්තකුට දැන්වීම කිරීම අහම්බෙන් අත්හැරීම හෝ ඒ තැනැත්තාට ඒ දැන්වීම නොලැබීම නිසා යම් මහා සභා රැස්වීමක කටයුතු අවලංගු නොවිය යුතු ය.

(ආ) මහා සභා රැස්වීමක් කැඳවෙන සෑම දැන්වීමක් ම සෑම සාමාජිකයකු ම වෙත තැපෑලෙන් යවනු ලැබිය යුතු අතර රැස්වීමේ ස්ථානය, දිනය හා වේලාව එහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය යුතු ය. සිරිත් පරිදි වූ කටයුතු නොවන කටයුතු කෙරෙන මහා සභා රැස්වීමක් සම්බන්ධයෙන් එහි දී කෙරෙන කටයුතුවල සාමාන්‍ය ස්වභාවය දැන්වීමෙහි නිශ්චිතව සඳහන් විය යුතු අතර, යම් යෝජනාවක් විශේෂ යෝජනාවක් ලෙස යෝජනා කළ යුතු නම් ඒ වගට වූ ප්‍රකාශයක් හා විශේෂ යෝජනාවේ විස්තර දැන්වීමෙහි අන්තර්ගත විය යුතු ය.

මහා සභා රැස්වීම්වල කටයුතු.

4. (අ) මහා සභා රැස්වීමක ගණපූරණය ඇත්නම් මිස කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතු ය. පැමිණ සිටින සාමාජිකයන් හත් දෙනකු සියලු කාර්යයන් සඳහා ගණපූරණයක් විය යුතු ය.

(ආ) රැස්වීමක් සඳහා නියමිත වේලාවට පසු පැය භාගයක් ඇතුළත ගණපූරණයක් නො වී නම්, ඒ රැස්වීම සාමාජිකයන්ගේ ඉල්ලීම පිට කැඳවනු ලැබී නම් එය විසුරුවා හරිනු ලැබිය යුතු ය. අන් කිසි අවස්ථාවකදී වූ විට එය ඊළඟට එළඹෙන සතියේ ඒ දවසට ම, ඒ වේලාවට ම හා ස්ථානයේදී හෝ මණ්ඩලය විසින් නිශ්චය කළ හැකි අන් කිසි දවසකට හා අන් කිසි වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීමට කල් තැබූ ලෙස පැවතිය යුතු අතර එසේ කල් තැබූ රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවේ සිට විනාඩි පසළොසක් ඇතුළත ඒ රැස්වීමේ ගණපූරණයක් නො වී නම් පැමිණ සිටින සාමාජිකයන් ගණපූරණයක් ලෙස සැලකිය යුතු ය.

(ඇ) සභාපති, යම් මහා සභා රැස්වීමක මූලාසනය දැරිය යුතු අතර සභාපති පැමිණ නොසිටින විට උප සභාපති මූලාසනය දැරිය යුතු ය; එහෙත් යම් රැස්වීමක් ආරම්භවීමට නියමිත වේලාවට පසු විනාඩි පසළොසක් ඇතුළත ඒ දෙදෙනාගෙන් එක් කෙනෙක්වත් ඒ රැස්වීමට පැමිණ නොසිටිනම් හා රැස්වීම පවත්වාගෙන යාමට ද අදහස් කැරේ නම් ද පැමිණ සිටින මණ්ඩලයේ සියලුම සාමාජිකයන් විසින් මූලාසනය දැරීම ප්‍රතික්ෂේප කරනු ලැබේ නම් ද පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් එක් සාමාජිකයකු සභාපති වශයෙන් තෝරා ගත යුතු ය.

(ඈ) යම් මහා සභා රැස්වීමකදී ඒ රැස්වීමේ ඡන්දය විමසීමට ඉදිරිපත් කරන ලද යෝජනාවක් අත් ඔසවා කැමැත්ත ප්‍රකාශ කිරීමකින් තීරණය කරනු ලැබිය යුතු ය.

(ඉ) යෝජනාවක් සම්මත වූ බවට හෝ ඒකච්ඡන්දයෙන් සම්මත වූ බවට හෝ විශේෂ වැඩි ඡන්දයකින් සම්මත වූ බවට හෝ නිශ්ප්‍රභ වූ බවට හෝ විශේෂ වැඩි ඡන්දයකින් සම්මත නොවූ බවට සභාපති විසින් කරනු ලබන ප්‍රකාශයක් හා ඒ විගට වාර්තා පොතෙහි කරනු ලබන සටහනක් ඒ යෝජනාව සඳහා හෝ එයට විරුද්ධව වාර්තා ගත වූ ඡන්ද සංඛ්‍යාව හෝ ප්‍රමාණය පිළිබඳ සාක්ෂියක් නොමැති ව ඒ පිළිබඳ ව තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

(ඊ) ඡන්ද සමාන ව බෙදී ගියහොත් රැස්වීමේ මූලාසනය දරන්නාට සාමාජිකයකු වශයෙන් ඔහු සතු ඡන්දයට අතිරේක ව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

**සාමාජිකයන්ගේ ඡන්ද.**

5. (අ) කිසිම සාමාජිකයකුට මණ්ඩලය විසින් අන්‍යාකාරයකින් නිශ්චය කරන්නේ නම් මිස මහා සභා රැස්වීමකදී ඡන්දය දීමට හෝ සාමාජිකයකු වශයෙන් යම් වරප්‍රසාදයක් පාවිච්චි කිරීමට, ඔහු විසින් සංස්ථාවට ගෙවිය යුතු සියලු මුදල් ගෙවා ඇත්තේ නම් මිස හිමිකම් නොතිබිය යුතු ය. ඉහත කී කොන්දේසියට යටත් ව සෑම සාමාජිකයකුට ම එක් ඡන්දයක් තිබිය යුතු ය.

(ආ) යම් ඡන්ද හිමියකුගේ සුදුසුකම පිළිබඳ ව කිසිම විරෝධතාවක්, විරෝධතාව දක්වනු ලැබූ ඡන්දය දිය යුතු හෝ පාවිච්චි කළයුතු රැස්වීමේදී හෝ අබාලව කල් තබන ලද රැස්වීමේදී හැර දක්වනු නොලැබිය යුතු අතර එවැනි රැස්වීමකදී ඉඩ නොදෙනු නොලැබූ සෑම ඡන්දයක් ම සියලු කාර්යයන් සඳහා වලංගු විය යුතු ය. යථා කාලයේදී දක්වනු ලැබූ එවැනි යම් විරෝධතාවක් රැස්වීමේ සභාපති වෙත යොමු කරනු ලැබිය යුතු ය. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

**වාර්ෂික මහා සභා රැස්වීම.**

6. (අ) වාර්ෂික මහා සභා රැස්වීම එක් එක් වර්ෂයේ ජනවාරි මාසය තුළ දී පවත්වනු ලැබිය යුතු ය.

(ආ) වාර්ෂික මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට නිලධරයන් තෝරා පත් කර ගැනීම හා කලින් වර්ෂයේ සැප්තැම්බර් මාසයේ තිස් වන දිනයෙහි පැවති පරිදි වාර්ෂික වාර්තාව හා ගණන් ප්‍රකාශය ඉදිරිපත් කිරීම ඇතුළත් විය යුතු ය. න්‍යාය පත්‍රය රැස්වීමේ දිනයට සති දෙකකටවත් කලින් සාමාජිකයන් වෙත යැවිය යුතු ය.

(ඇ) යම් මහා සභා රැස්වීමකදී යෝජනා කිරීමට අදහස් කෙරෙන යම් යෝජනාවක් පිළිබඳ දැන්වීම ඒ රැස්වීමේ දිනයට සති තුනකටවත් කලින් ලේකම් වෙත ලැබිය යුතු ය.

**අති විශේෂ මහා සභා රැස්වීම.**

7. සංස්ථාවේ ලියාපදිංචි කරන ලද මුළු සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් හතරෙන් එකක්වත් විසින් අත්සන් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් පසු ලේකම් විසින් අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳ විය යුතු ය. ඒ රැස්වීම පිළිබඳ දැන්වීම එහි න්‍යාය පත්‍රය සමග යෝජිත රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් සති දෙකකටවත් කලින් සාමාජිකයන් වෙත යැවිය යුතු ය.

**සාමාජික ගාස්තු.**

8. සාමාජික ගාස්තුව වර්ෂයකට රුපියල් විසි පහක් විය යුතු ය.

**මණ්ඩලයේ සාමාජිකයන් හා ඔවුන්ගේ යුතුකම්.**

9. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(i) සභාපතිවරයෙක්,

(ii) උප සභාපතිවරයෙක්.

(iii) ලේකම්වරයෙක්,

(iv) භාණ්ඩාගාරික කෙනෙක් හා

(v) හත් දෙනකුගෙන් යුත් කමිටුවක්.

(2) සභාපති වාර්ෂික ව තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. සභාපතිවරයකු විසින් අනුක්‍රමික වර්ෂ තුනකට වැඩි කාලයක් ධූරය නො දැරිය යුතු ය. සභාපති විසින් සියළුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය; සභාපති පැමිණ නොසිටින විට උපසභාපති විසින් ද ඔහු නොපැමිණ සිටින විට මණ්ඩලයේ සාමාජිකයකු විසින් ද මූලාසනය ගත යුතු ය. මූලාසනය ගන්නා තැනැත්තාට සියළුම රැස්වීම්වලදී තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) (අ) ලේකම් එක් වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර නැවත තෝරා පත් කර ගැනීමට සුදුසු විය යුතු ය.

(ආ) (i) රැස්වීම් කැඳවීම;

(ii) රැස්වීම් පිළිබඳ දැන්වීම් හා එක් එක් රැස්වීමේ න්‍යාය පත්‍රය සංසරනය කිරීම;

(iii) රැස්වීම්වල වාර්තා තැබීම; හා

(iv) සංස්ථාවේ වාර්තා සම්බන්ධයෙන් වගකීම

ලේකම්ගේ යුතුකම විය යුතු ය.

(4) (අ) භාණ්ඩාගාරික එක් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුසු විය යුතු ය.

(ආ) (i) සාමාජික ගාස්තු එකතු කිරීම,

(ii) අය වැය ගණන් පවත්වා ගෙන යාම හා වාර්ෂික මහා සභා රැස්වීමේදී ගණන් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම, සහ

(iii) සංස්ථාව වෙනුවෙන් සභාපති සමග චෙක්පත් අත්සන් කිරීම භාණ්ඩාගාරිකගේ යුතුකම විය යුතු ය.

(ඇ) මණ්ඩලයේ අන් සෑම සාමාජිකයකු ම එක් අවුරුදු කාලයකට තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුසු විය යුතු නමුදු අනුක්‍රමික වර්ෂ තුනකට වැඩි කාලයක් එසේ ධූර නො දැරිය යුතු ය.

10. මණ්ඩලය යටත් පිරිසෙයින් සෑම මාස දෙකකට වරක්වත් රැස්විය යුතු ය. මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය හයක් විය යුතු ය. මණ්ඩලයේ රැස්වීම.

11. සංස්ථාවේ විද්‍යාත්මක වැඩ පිළිවෙල සැලසුම් කිරීම සඳහා මණ්ඩලය වග කිව යුතු අතර අවශ්‍ය වන පරිදි හා අවශ්‍ය වන විට අනු කමිටු ඇති කිරීමටත් එබඳු කාර්යයක් සඳහා යම් සාමාජිකයකුගේ සේවාවන් තෝරා ගැනීමටත් එයට බලය තිබිය යුතු ය. තව තෝරා ගැනීමේ බලය.

12. සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අදහස් කෙරුණු ප්‍රදාන සංස්ථාව වෙනුවෙන් පිළිගැනීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය. ප්‍රදාන.

13. (අ) සංස්ථාවේ සියලුම මුදල් සංස්ථාවේ නමින් මණ්ඩලය විසින් තෝරා ගනු ලබන බැංකුවක තැන්පත් කරනු ලැබිය යුතු අතර භාණ්ඩාගාරික හා සභාපති විසින් ඒ ගිණුම් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. බැංකු ගිණුම් හා ගණන් පොත්.

(ආ) මණ්ඩලය විසින්,—

(i) සංස්ථාවට ලැබෙන හා සංස්ථාව වියදම් කරන සියළුම මුදල් සම්බන්ධයෙන් හා අය වැය සිදුවන කරුණු සම්බන්ධයෙන් ද

(ii) සංස්ථාවේ වත්කම් හා ණයතුරුස් සම්බන්ධයෙන් ද

නිසි ගණන් පොත් තැබවීමට සැලැස් විය යුතු ය.

(ඇ) ගණන් පොත් සංස්ථාවේ කාර්යාලයෙහි හෝ මණ්ඩලය යෝග්‍යයයි සිතන අන් කිසි ස්ථානයක තැබිය යුතු අතර, මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් කාර්යාල වේලාවල දී ඒවා පරීක්ෂා කිරීමට විවෘත ව තිබිය යුතු ය.

ප්‍රරප්පාඩු තිබුණ ද මණ්ඩලය විසින් ක්‍රියා කළ හැකි බව.

14. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීම ගැන නොතකා ක්‍රියා කිරීමට එයට නිසි බලය තිබිය යුතු ය.

විධිවිධාන නොසැලසුණු කරුණු.

15. මේ රීතිවල විධිවිධාන සලසනු නොලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා සියලු සාමාජිකයන් කෙරෙහි අනුගම්‍ය විය යුතු ය.

අර්ථ නිරූපණය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ රීතිවල—

"පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ අංක  දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත අදහස් වේ;

"සංස්ථාව" යන්නෙන් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය අදහස් වේ;

"මණ්ඩලය" යන්නෙන් සංස්ථාවේ මණ්ඩලය අදහස් වේ;

"සාමාජිකයා" යන්නට ආරම්භක සාමාජිකයෙක් ද ඇතුළත් වේ; තව ද

"පශ්චාත්-උපාධි වෛද්‍ය අධ්‍යාපන ආයතනය" යන්නෙන් 1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය සමග අනුබද්ධවීමෙන් පිහිටුවන ලද පශ්චාත්-උපාධි වෛද්‍ය අධ්‍යාපන ආයතනය අදහස් වේ.

## දෙවන උපලේඛනය

### ආරම්භක සාමාජිකයෝ

1. වෛද්‍ය මින්නෙමරක්කලගේ පිලිප් මිචෙල් කුරේ, එල්. ආර්. සී. පී. (ලංඩන්); එම්. ආර්. සී. එස්. (එංගලන්ත); එම්. බී. බී. එස්. (ලංඩන්); 14, සෙල්බෝන් පාර, කොළඹ 3.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1938 ජූලි මස 28 වන දින.

2. වෛද්‍ය බෙන්හරවිබුවේඡ්ඩිගේ දොන් ජයරත්න ද සිල්වා, එම්. බී. බී. එස්. (ලංකා); සෙන්ට්‍රල් බෙහෙත් ශාලාව සහ ශෛල්‍යාගාරය, මහරගම.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1949

3. වෛද්‍ය කුමාරසිංහ ආරච්චිගේ දොන් රෙජිනෝල්ඩ් ජේම්ස් ඩැනියල් පීරිස්, ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයේ අපර අයිශූනපත්‍ර පශ්‍ජිකය; එල්. එම්. ඇන්ඩ් එස්. (ලංකා); 757, බිලුමැන්ඩල් පාර, කොළඹ 15.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1942 මාර්තු මස 28 වන දින.

4. වෛද්‍ය ගන්කන්දෙ මුහන්දිරම්ගේ සිත්නිලමෙ, එම්. බී. බී. එස්. (ලංකා); 3, 2 වන ගල්පොත්ත පටුමග, නාවල.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1949 අගෝස්තු මස 26 වැනි දින.

5. වෛද්‍ය වලස්ලි සුමනසිංහ කොටගම, එම්. බී. බී. එස්. (ලංකා); එම්. ආර්. සී. පී. (ග්ලාස්ගෝ); ඩී. සී. එච්. (එංගලන්තය); රෙස්පිටිය මාවත කොළඹ 7.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1954 අප්‍රේල්

6. වෛද්‍ය තන්‍යාගරාජා නාගේන්ද්‍ර, එල්. එම්. එස්. (ලංකා); 106/3, රෝස්මිඩ් පෙදෙස, කොළඹ 7.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1935 මාර්තු

7. වෛද්‍ය මොහමඩ් ෂෙරීෆ් මොහමඩ් රෆීපාසි, එම්. බී. බී. එස්. (ලංකා); ඩී. එල්. ඕ. ආර්. සී. එස්. (එංගලන්ත); ආර්. සී. පී. (ලංඩන්); "ඇල්කසාර්", 116, හෝටන් පෙදෙස, කොළඹ 7.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1943 අගෝස්තු

8. වෛද්‍ය ඒ. එච්. හසාරි, එම්. බී. බී. එස්. (ලංකා); 10, අශෝක උද්‍යානය, කොළඹ 4.

   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1956 පෙබරවාරි.

## ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 26 දරන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය 11 වෛද්‍යවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

9. වෛද්‍ය අතුකෝරල ඉදියන්සේලාගේ කරුණාරත්න, එම්. බී. බී. එස්., ඩී. ඊ. එම්. ඇන්ඩ් එච්.; 14/2, උදයාන වීදිය, කොළඹ 2.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1951 ජනවාරි.

10. වෛද්‍ය ඔස්ටින් මොරිස් ප්‍රනාන්දු, එල්. එම්. එස්. (ලංකා); 108, ගාලු පාර, දෙහිවල.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1933 අගෝස්තු 4 වන දින.

11. වෛද්‍ය මයිල්වාගනම් සිවසුබ්‍රමනියම්, එම්. බී. බී. එස්. (ලංකා); 47ඒ, වැරලුප්පෙ කෙලින් පාර, රත්නපුර.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1956 මාර්තු.

12. වෛද්‍ය පිවඩ පෙරේරා විජේරත්න, එම්. ඩී., එල්. එම්. එස්., 152 කින්සි පාර, කොළඹ 8.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1934 මාර්තු.

13. වෛද්‍ය හෙක්ටර් ජයලත්, එම්. බී. බී. එස්. (ලංකා), ඩී. සී. එච්. (ලංඩන්), 412, කෙලින් වීදිය, මීගමුව
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1952 දෙසැම්බර්.

14. වෛද්‍ය රසිලි මයිකල් ලින්වන් ප්‍රනාන්දු, එම්. බී. බී. එස්. (ලංකා), 44, කොළඹ පාර, කුරුණෑගල.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1951 සැප්තැම්බර්.

15. වෛද්‍ය ජයසුමන වරුසවිතාන, එම්. බී. බී. එස්. (ලංකා), 451/2, හැව්ලොක් පාර, කොළඹ 6.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1951 නොවැම්බර් මස 20 වන දින.

16. වෛද්‍ය දොන් පීටර් කන්නන්ගර, එල්. එම්. එස්., 115, කෙලින් පාර, කෑගල්ල.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1937.

17. වෛද්‍ය අතුකෝරලගේ දොන් පීටර් ඇල්බට් විජේගුණවර්ධන, එල්. එම්. එස්. (ලංකා), ඩී. සී. එච්., ආර්. සී. පී. සහ ආර්. සී. එස්. (අයර්ලන්තය), 7, බොරැල්ල හරස් පාර, බොරැල්ල.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1932 ජූනි.

18. වෛද්‍ය දොන් හෙක්ටර් පෙරේරා රාජපක්ෂ සේනානායක, එම්.බී.බී.එස්. (ලංකා), 50/5බී, සිරිපා පාර, කොළඹ 5.
   වෛද්‍යවරයකු වශයෙන් බැඳුණු දිනය—1951 අප්‍රේල්.